NSB

# ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ඉතිරිකිරීමේ බැංකුවේ නියමුවා වීමට ඔබ සූදානම්ද?

වසර 186 ක සාඩම්බර උරුමයකට හිමිකම් කියන 250 කට අධික දිප ව්‍යාප්ත ශාඛා ජාලයකින් ශක්තිමත්වූ හා ජාත්‍යන්තර වෙළඳපොළ හා සබැඳුණු ශ්‍රී ලංකා රජයේ සහතිකය 100% ක් හිමි රාජ්‍ය බැංකුවක් වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව නව මානයක් කරා ගෙන යාහැකි වෘත්තීමය සුදුසුකම් සපුරාලන උපායමාර්ගික නියමුවෙකු අපි සොයන්නෙමු.

## සාමානයාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

ඉතිරිකිරීමේ බැංකු ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා වලට මුල පිරීමෙහිලා බැංකුවට අවැසි ශක්තිය සැපයීම සඳහා පෙරමුණ ගැනීම, සුදුසුකම් සපුරාලන අයදුම්කරු වෙතින් අපේක්ෂිතය. ආයතනයේ ස්ථාවරත්වය, නිපුණත්වය, විශ්වසනීයත්වය සුරක්ෂිත කරගනිමින් ක්ෂේත්‍රයේ හොඳම කාර්යසාධනයක් පෙන්නුම් කරන ආයතනය බවට පත්කිරීමේ ඉලක්කය උදෙසා ඔහු/ඇය විසින් ස්වකීය ප්‍රවීණත්වය උපයෝගී කරගත යුතුය.

**අපේක්ෂිත කාර්යභාරය:**

- අධ්‍යක්ෂ මණ්ඩලය සමග පෙරමුණේ සිට බැංකුව මෙහෙයවීම හා ආයතනික උපායමාර්ගික සැලසුම් සකස් කිරීමෙහි නියුතු වීම.
- එකී උපායමාර්ග, ව්‍යාපාරික කටයුතු වලට පරිවර්තනය කිරීම ඔස්සේ වෙළඳපොළ කොටස වර්ධනය කරගැනීම, රඳවා ගැනීම හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය යන අරමුණු සාක්ෂාත් කරගැනීම.
- බැංකුවේ කෙටි කාලීන හා දීර්ඝ කාලීන උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග දිරිගන්වමින් ආයතනික සංස්කෘතියෙහි දිශානතිය හා පසුබිම සැකසීම.
- බැංකුවේ පරිපාලනය, නියාමන අනුකූලතාවය, අවදානම් කළමනාකරණය, ද්‍රවශීල කළමනාකරණය, ප්‍රාග්ධන කළමනාකරණය සහ මූල්‍ය කළමනාකරණය යන අංශ අධීක්ෂණය කරන අතරතුර බැංකුවේ හා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හා නියාමන සමගින් බැංකුවේ මෙහෙයුම් අනුකූල වන බවට වගබලා ගනිමින් ආයතනයේ ප්‍රතිපත්ති හා මුලපිරීම් වලට අදාල සෑම අංශයකටම නායකත්වය සැපයීම.
- නිරවද්‍ය තොරතුරු නිසිකාලීනව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය ඉටු කිරීමට පහසුකම් සලසන අතර කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය අතර සම්බන්ධීකරණය කිරීම සහ සභාපතිතුමිය හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.
- විශිෂ්ට ප්‍රතිඵල අත්පත් කරගනිමින් ආයතනික මෙහෙවර සපුරාලීමේ අවසන් ඉලක්කය වෙත ළඟාවීම සඳහා විවිධ කණ්ඩායම් දිරිමත් කිරීමට සහය වන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හා පවත්වා ගැනීම.
- බැංකුව ව්‍යාපාරික කටයුතු වල නියුතු වන සෑම අවස්ථාවකදීම හා ස්ථානයකදීම ඉහළ මට්ටමේ ආයතනික පුරවැසිභාවයක් හා සමාජ වගකීමක් ආයතනය විසින් පවත්වාගනු ලබන බවට සහතිකවීම.
- ආයතනයේ වත්මන් හා ඉදිරි අවශ්‍යතා සපුරාලීම සඳහා සෑම ස්ථරයකදීම ආයතනය ශක්තිමත් කිරීම හා බැංකුවේ අනාගත සාර්ථකත්වය කරා මෙහෙයවීමට අවැසි කුසලතා ගොඩනැංවීම හා දියුණු කිරීම.

**අපේක්ෂිත සුදුසුකම්:**

- විශිෂ්ට අධ්‍යයන කාර්යසාධනයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය/ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය/වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි අධි සාමාජිකත්වය අතිරේක සුදුසුකමක් වනු ඇත.
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.
- ප්‍රමුඛ පෙළේ දේශීය/ජාත්‍යන්තර බැංකුවක/මූල්‍ය ආයතනයක ආයතනික කළමනාකරණ මට්ටමෙහි වසර 5 ක පළපුරුද්ද ඇතුළුව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද සහිත විශිෂ්ට සේවා වාර්තාවකට හිමිකම් කීම.
- උපායමාර්ගික දැක්මක් මත පදනම්වූ ඉදිරිගාමී ප්‍රවේශයක් සැපයීම තුළින් බැංකුවේ නිම් වළලු පුළුල් කිරීමට සමත් හැකියාවෙන් හා විශ්වසනීයත්වයෙන් හෙබි පුද්ගලයෙකු වීම. ඉහළ සන්නිවේදන හා අන්තර්පුද්ගල කුසලතා සහිතවීම අත්‍යවශ්‍ය වේ.
- වයස අවුරුදු 40 ට නොඅඩු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

**අනෙකුත් අතුරු ප්‍රතිලාභ සහිත ආකර්ෂණීය වේතනයක් සුදුසුකම් සපුරාලන අයදුම්කරුට හිමිවේ.**

ඔබගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව (resume) සහ ඥාති සම්බන්ධයක් නොමැති නිර්දේශකයන් (non-related referees) දෙදෙනෙකුගේ සම්බන්ධ කරගැනීමේ තොරතුරු සමග අයදුම් කළ යුතු වේ. මෙම පුවත්පත් දැන්වීම පළවූ දින සිට දින 14 ක් ඇතුළත **"සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන), ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක: 255, ගාලු පාර, කොළඹ 03"** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් හෝ **careers@nsb.lk** වෙත විද්‍යුත් තැපැල මගින් අයදුම්පත යොමු කළ යුතුය. විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂයය යටතේ හෝ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුර"** ලෙස සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. කුසලතා පදනම මත (on merit basis) පමණක් තෝරාගැනීම සිදු කරනු ලබන අතර මේ සම්බන්ධයෙන් කිසිදු ආකාරයකින් බලපෑම් කිරීම අයදුම්කරුගේ නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන)**
මානව සම්පත් සංවර්ධන අංශය
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
ප්‍රධාන කාර්යාලය
කොළඹ 03.

100%ක් රාජ්‍ය වගකීම

ඇමතුම් මධ්‍යස්ථානය: 0112 379 379
වෙබ් - www.nsb.lk

**ඔබේ මුදලට සුරක්ෂිතම ස්ථානය ජාතික ඉතිරිකිරීමේ බැංකුව.**

NSB